# ලංකා නිෂ්පාදන කොන්කිරීමේ කොටි හිතවාදී සැලැස්මක්



## ඇමැති මිලින්ද හෙළි කරයි

(රන්ජිත් ආනන්ද ජයසිංහ)

ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කෙරෙන ලේ තැවරුණු ඇඟලුම් (බ්ලඩ් ගාමන්ට්ස්) මිලදී නොගන්නා ලෙස කොටි හිතවාදී යුරෝපා දෙමළ ඩයස්පෝරාව ප්‍රචාරයක් දියත්කර ඇතැයි අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍ය මිලින්ද මොරගොඩ මහතා ඉරිදා ලංකාදීපයට පැවැසීය.

පසුගිය සති කිහිපයක් තිස්සේ අන්තර් ජාලය උපයෝගී කරගෙන ගෙනයන මෙම ප්‍රචාරයේ සත්‍ය අසත්‍යතාව ගැන යුරෝපයේ

*11 වැනි පිටුවට...*

**ලංකා නිෂ්පාදන කොන්කිරීමේ...** *... 1 වැනි පිටුවෙන්*

තානාපතිවරුන් ගණනාවක් අධිකරණ අමාත්‍යවරයා ලෙස තමන්ගෙන් විමසූ පසු තමන් ඔවුනට යථාර්ථය පැහැදිලි කරදුන් බව මිලින්ද මොරගොඩ මහතා ඉරිදා ලංකාදීපයට කීය.

ඇඟලුම්වලට පමණක් නොව අනෙක් නිෂ්පාදන වර්ගද ශ්‍රී ලංකාවේ නිපදවන ලේ තැවරුණ භාණ්ඩ ලෙස හඳුන්වාදී ඇතැයි කී අමාත්‍යවරයා ශ්‍රී ලංකාවේ ආයෝජනය නොකරන්නැයි යුරෝපයේ වෙබ් අඩවිවල දැන්වීම් පළ කෙරෙන වගද පැවැසීය. මේ අසත්‍ය ප්‍රචාර ගැන යුරෝපා තානාපතිවරුන් පෞද්ගලිකව තමන් විසින් දැනුවත් කර ඇතැයිද හෙතෙම කීය.